2025.07.25

**ප්‍රියන්ත ප්‍රදීප් රණසිංහ සිංහලට නැගූ, බීනා සාවර්ගේ ශ්‍රී ලංකාව ගැන වාතර්ා චිත්‍රපටය, පුවත්පත් ආයතනයේදී ප්‍රදශර්නය කෙරේ**

ප්‍රියන්ත ප්‍රදීප් රණසිංහ විසින් 'ණය ප්‍රජාතන්ත්‍රවාදය: ශ්‍රී ලංකාව - සිරස්තලවලින් ඔබ්බට' යන නමින් සිංහලට නගා නිෂ්පාදනය කළ, බීනා සාවර්ගේ 'Democracy in Debt: Sri Lanka - Beyond the Headlines' අන්තජර්ාතික වාතර්ා චිත්‍රපටයේ, එම සිංහල අනුවාදය, මේ මස (ජූලි 30) ප.ව. 4.00 ට, කොළඹ, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී ප්‍රදශර්නය කෙරේ. එම අවස්ථාවට මුල් චිත්‍රපටය නිෂ්පාදනය කළ, දැනට ඇමරිකාවේ වෙසෙන, පාකිස්ථාන බහු මාධ්‍ය, ජනමාධ්‍යවේදිනියක් වන බීනා සාවර්ද එක්වීමට නියමිතයි.

බීනා සාවර් ශ්‍රී ලංකාව ගැන පසුගිය වසරේදී ඉංග්‍රීසියෙන් නිෂ්පාදනය කළ මිනිත්තු 25ක මෙම වාතර්ා චිත්‍රපටයට, ඇමරිකා එක්සත් ජනපදයේ Pulitzer Center හි අනුග්‍රහය ලැබී තිබිණි.

ශ්‍රී ලංකාවේ දුරස්ථ ගම්මානයක(දුටුවැව) මෙන්ම කොළඹදී රූගත කරන ලද මෙම චිත්‍රපටය, ආණ්ඩුකරණය, වගවීම සහ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් ගැන ඇති චිරස්ථායී බලාපොරොත්තු සම්බන්ධ විශ්වීය අභියෝග පිළිබඳ බහු ස්ථර ආඛ්‍යානයක් සපයයි. එය ශ්‍රී ලංකාවට පමණක් නොව, ඉන්දියාව, බංග්ලාදේශය, ඇමරිකා එක්සත් ජනපදය ඇතුළුව ප්‍රජාතන්ත්‍රවාදය සහ වගවීම ආරක්ෂා කිරීමට ජනතාව අරගල කරන ඕනෑම තැනකට අදාළ වේ. ශ්‍රී ලංකාවේ පසුගිය ජනාධිපතිවරණයට පෙර, ශ්‍රී ලංකාව, පාකිස්තානය සහ එක්සත් ජනපදය ඇතුළු රටවල් රැසක මෙම චිත්‍රපටය ප්‍රදශර්නය කර ඇත. මහාද්වීප පහක, රටවල් 20 කට ආසන්න සංඛ්‍යාවක සහ ස්ථාන 70 කට අධික ප්‍රමාණයක තිරගත කිරීම්වලින් එහි විචාරාත්මක සහ තීරණාත්මක සාථර්කත්වය පැහැදිලි වෙයි. ඉන්දියාවේ The Wire මාධ්‍ය ආයතනයේ සිට පකිස්ථානයේ Dawn මාධ්‍ය ආයතනය දක්වා ප්‍රකාශයට පත් කරන ලද ධනාත්මක මාධ්‍ය සමාලෝචන එම සාථර්කත්වය තව දුරටත් තහවුරු කරයි.

මෙය ශ්‍රී ලංකාවට වැදගත් වන්නේ, පසුගිය වසරේ ජනාධිපතිවරණය මගින් ඇති කරන ලද සමාජ විප්ලවය සහ දේශපාලන පරිවතර්නය පිළිබඳව මෙම චිත්‍රපටය පුරෝකථනය කිරීමයි. එමෙන්ම, විදේශීය වාතර්ා චිත්‍රපටයක් සිංහලෙන් නිෂ්පාදනය කරන ලද පළමු අවස්ථාව මෙයයි.

බීනා සාවර් බහු මාධ්‍ය, ජනමාධ්‍යවේදිනියකි. එමෙන්ම සංස්කාරකවරියක් සහ වාතර්ා චිත්‍රපට නිෂ්පාදකවරියකි. ඇය පාකිස්ථාන මුද්‍රිත හා රූපවාහිනී මාධ්‍යවල කතෘ මණ්ඩලයන්හි ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවා ඇති අතර, Himal Southasian සඟරාව සහ Panos South Asia ආදී මාධ්‍ය ව්‍යාපාර කිහිපයක ආරම්භක කණ්ඩායම්වල කටයුතු කර තිබේ. ඇය ලන්ඩන් විශ්වවිද්‍යාලයේ- ගෝල්ඩ්ස්මිත් විද්‍යාලයෙන් රූපවාහිනී වාතර්ා චිත්‍රපටය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර, ඇගේ ජාත්‍යන්තර අධිශිෂ්‍යත්ව අතරට හාවඩ් විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය සඳහා වන, Nieman Foundation අධිශිෂ්‍යත්වය සහ හාවඩ් කෙනඩි පාසලේ මානව හිමිකම් ප්‍රතිපත්ති සඳහා වූ Carr Center හි අධිශිෂ්‍යත්වයද ඇතුළත් වේ. 2011 සිට, බීනා ඇමරිකා එක්සත් ජනපදයේ බොස්ටන් ප්‍රදේශයේ පදිංචිව සිටින අතර, ඇය ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලය, බ්‍රවුන් විශ්වවිද්‍යාලය, හාවඩ් ගිම්හාන පාසල සහ එමසර්න් විද්‍යාලයේ පුවත්පත් කලාව ඉගැන්වූවාය. 2021 අගෝස්තු මාසයේදී, බීනා විසින් සංයුක්ත විශේෂාංග සේවා නිෂ්පාදනය කරන ස්වාධීන මාධ්‍ය ආයතනයක් වන "සපාන් නිවුස්" දියත් කරන ලදී. එය, එම වසර මුලදී දියත් කරන ලද ස්වෙච්ඡාදායක ව්‍යාපෘතියක් වන වන දකුණු ආසියානු සාම ක්‍රියාකාරී ජාලය හෙවත් සපාන් (Southasia Peace Action Network,/ Sapan ) හි ආරම්භක අදියර තවත් ඉදිරියට යාමකි.

'ණය ප්‍රජාතන්ත්‍රවාදය: ශ්‍රී ලංකාව - සිරස්තලවලින් ඔබ්බට' නමින් එහි සිංහල නිෂ්පාදනය, පරිවතර්නය සහ උපදේශනය සිදු කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ මුද්‍රිත, විද්‍යුත් හා නව මාධ්‍ය පිළිබඳ අත්දැකීම් ඇති, වසර 20 කට අසන්න කාලයක් මාධ්‍යවේදියෙකු ලෙස ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතනවල කටයුතු කළ ප්‍රියන්ත ප්‍රදීප් රණසිංහ විසිනි.

..................

<u>මේ සම්බන්ධයෙන් මාධ්‍ය ආවරණයක් ලබාදෙන ලෙසද, චිත්‍රපටය නැරඹීම සඳහා එක්වන ලෙසද ආරාධනා කරමු.</u>

**ස්ථානය** - ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, 96, කිරුළ පාර, කොළඹ 05

**දිනය, වෙලාව** - <u>2025 ජූලි 30 බදාදා ප.ව. 4.00-6.00</u>

**තවත් විස්තර** - 0717640015

ප්‍රියන්ත ප්‍රදීප් රණසිංහ - 0773124550